# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2282/22 - 2022 මැයි මස 31 වැනි අඟහරුවාදා - 2022.05.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 මැයි මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

### රෙගුලාසි

1. මෙම රෙගුලාසි "**2022 අංක 09 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි බලාත්මක වන දිනය, 2022 ජූනි මස 07 වැනි දින හෝ ඊට පසුව ශ්‍රී ලංකාවේ වරාය/ගුවන් තොටුපළ වෙත ළඟා වන භාණ්ඩ සඳහා පමණක් අදළ වන පරිදි මෙයින් සංශෝධනය කෙරේ.

3. ප්‍රති-අපනයන අරමුණු සඳහා විවෘත ගිණුම් ගෙවීම් ක්‍රම යටතේ භාණ්ඩ ආනයනය කිරීමේ ක්‍රියාපටිපාටීන් සරල කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීමට, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙත මෙයින් බලය පවරනු ලැබේ.

EOG 06 - 0037

1A - PG 5858 - 456 (2022/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*